

සංක්‍රාන්තික යුක්තිය:

# සිද්ධි අධ්‍යයනය ශ්‍රී ලංකාව

**යුක්තිය සහ අයිතිවාසිකම් පිළිබඳ ආසියානු වැඩසටහන**
**සහ**
**සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය**

ajar
asia justice and rights

Transitional Justice
Asia Network

SURIYA
Women's Development Centre

සංක්‍රාන්තික යුක්තිය: සිද්ධි අධ්‍යයනය ශ්‍රී ලංකාව

**යුක්තිය සහ අයිතිවාසිකම් පිළිබඳ ආසියානු වැඩසටහන සහ සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය**

TRANSITIONAL JUSTICE ASIA NETWORK

SURIYA Women's Development Centre

### යුක්තිය සහ අයිතිවාසිකම් පිළිබඳ ආසියානු වැඩසටහන

ආසියානු යුක්තිය සහ අයිතිවාසිකම් (AJAR) යනු ඉන්දුනීසියාවේ ජකාර්තා නගරය පදනම් කරගත් කලාපීය මානව අයිතිවාසිකම් සංවිධානයකි. මෙම සංවිධානය ආයතනගත දණ්ඩමුක්තියට එරෙහිව සටන් කිරීමට සහ වගවීම, යුක්තිය සහ ආසියා පැසිපික් කලාපයේ මහා පරිමාණ මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම්වලින් ඉගෙන ගැනීමට ඇති කැමැත්ත පදනම් සංස්කෘතියක් ගොඩනැගීමට දායක වේ. වැඩි තොරතුරු සඳහා http://asia-ajar.org වෙබ් අඩවියට පිවිසෙන්න.

### සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය

සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය පිහිටුවන ලද්දේ කොළඹ සහ ඒ අවට ඇති සුහසාධන මධ්‍යස්ථානවල ස්ත්‍රීන්ගේ විශේෂ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ය. සූරියා සංවිධානය ඉතාමත් ප්‍රායෝගික ආකාරයට ස්ත්‍රීන්ගේ සහ ළමයින්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුවිශේෂ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරන අතර අහිමිවීම, බිය වැනි ඔවුන් මුහුණ දෙන අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ නව පරිසරයක ජීවිතය පවත්වා ගෙන යාමට සහාය දක්වයි. සූරියා සංවිධානය දැනට ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ජීවත්වන ස්ත්‍රීන් වෙනුවෙන් සහ ඔවුන්ගේ හඬ වශයෙන් ක්‍රියා කරන අතර සියලු ස්ත්‍රීන්ගේ දැක්ම පෙරමුණට ගෙන ඒමට ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. සූරියා සංවිධානය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලගැන්වීම, සංවර්ධනය සහ සංස්කෘතික වැඩ සටහන් හරහා දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවේ ස්ත්‍රීන් වෙනුවෙන් සහ ඔවුන් සමග වැඩ කිරීමට කැපව සිටින අතර ස්ත්‍රීන්ට එරෙහිව වෙනස්කොට සැලකීමෙන් තොර සමානාත්මතා සහ සාමකාමී සමාජයක් නිර්මාණය කිරීම අරමුණු කරයි. වැඩි විස්තර සඳහා: http://suriyawomn.org වෙත පිවිසෙන්න.

### යුක්තිය සහ අයිතිවාසිකම් සඳහා වන ආසියානු ජාලය

යුක්තිය සහ අයිතිවාසිකම් සඳහා වන ආසියානු ජාලය කලාපය පුරාම සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව ඉගෙන ගැනීමට සහ දැනුම ගොඩනැගීමට පහසුකාරකයෙකු ලෙසින් කටයුතු කරයි.

### ඡායාරූප:

1. 2009 සිට අධි ආරක්ෂිත කලාපයක් ලෙස හමුදා පාලනය යටතේ මුලතිවු දිස්ත්‍රික්කයේ කේප්පාපිලව් ගමේ අතින් ඇඳි සිතියමක් ස්ත්‍රියක් පෙන්වමින් සිටී. ඔවුහු දින 200ක් තිස්සේ හමුදා කඳවුර අබියස විරෝධතා ව්‍යාපාරයක් පවත්වති. සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය ඔවුන්ගේ ප්‍රයත්නයට සහ අරගලයට සහාය දක්වයි. (ඡායාරූපය. සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය)
2. මුස්ලිම් සහ දෙමළ ස්ත්‍රීහු එක්ව කෑම පිස බෙදා ගනිති. මුස්ලිම් ප්‍රජාව එල්.ටී.ටී.ඊ.ය විසින් 1990 දී මුලතිවු හි සිට පලවා හරින ලදී. ඔවුන්ට ආපසු පැමිණිය හැකි වූයේ 2012 දීය. (ඡායාරූපය සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය)
3. සූරියා සහයෝගිතා ගස (ඡායාරූපය: සූරියා කාන්තා සංවර්ධන කේන්ද්‍රය)
4. ශ්‍රී ලංකාවේ උතුරේ මුලතිව් හි යුද්ධයේ වින්දිතයින් අතර ප්‍රජාවැඩ පිළිබඳ ඡයාරූප (ඡායාරූප: සූරියා කාන්තා සංවර්ධනය කේන්ද්‍රය)

රජය විසින් බොහෝවිට ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය වශයෙන් හඳුන්වන ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය, තමිල් ඊළාම් විමුක්ති සංවිධානය (LTTE) හමුදාමය වශයෙන් පරාජය කිරීමත් සමග අවසන් විය. කෙසේ වුවත් ගැටුම වෙනත් ආකාරයෙන් බහුතර සිංහල බෞද්ධ ජාතිවාදය සහ ඔවුන් රාජ්‍ය බලය අත්කර ගැනීම, ශ්‍රී ලාංකික දෙමළ ජනතාවගේ දේශපාලන සමානත්වය, අභිමානය සහ ස්වයං පාලනයට ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සහ වාර්ගික ආගමික සුළුතර කොටස් කොන් කිරීම ඇතුළත් මූලික වශයෙන් දේශපාලනයේ වාර්ගික අනන්‍යතාවයන් තවමත් පවතී.

ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටුම ස්ථාන ගතකළ යුතු වන්නේ, නිදහසට පෙරත් ඉන් පසුවත් ශ්‍රී ලාංකික දෙමළ, ඉන්දීය සම්භවයක් ඇති දෙමළ, මුස්ලිම් සහ වෙනත් වාර්ගික ආගමික සුළුතරය ක්‍රමානුකූලව කොන් කිරීමෙන් සහ ඔවුන්ට එරෙහි සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය යන කාරණා සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරමිනි. එමෙන්ම ඉඩම් බෙදා දීම, විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සහ රජයේ රැකියා සහ වෙනත් සම්පත් ලබා ගැනීම ඇතුළත් ගැටුමේ දේශපාලන ආර්ථිකය විශේෂයෙන්ම 1977 සිට ආරම්භ වූ ආර්ථික ප්‍රතිසංශෝධන සමග මර්දනකාරී සහ ප්‍රජාතන්ත්‍රවාදී නොවන රාජ්‍යයකට යොමු විය.

සිංහල දෙමළ බෙදීම්වලින් ඔබ්බට, 19 වැනි ශත වර්ෂයේ වතුකරයේ වැඩට ගෙන එන ලද ඉන්දීය සම්භවයක් ඇති සිය දහස් ගණනාවක් වූ දෙමළ ජනතාවගේ ඡන්ද අයිතිවාසිකම් අහිමි කිරීමෙන් ආරම්භ වූ සුළු වාර්ගිකයින් අතර ගැටුම්වලට ශ්‍රී ලාංකික දෙමළ සහ මුස්ලිම් දේශපාලන නායකත්වයේ සහාය ලැබිණ. මුස්ලිම් ජනතාවට එරෙහිව එල්.ටී.ටී.ඊ.යේ මහා පරිමාණ ප්‍රචණ්ඩත්වය සහ ඉන් අනතුරුව ඇති වූ දෙමළ මුස්ලිම් විරසකකම ගැටුමේ අනෙක් පැතිමානයන් ය. 1987 ඉන්දියානු හමුදා මැදිහත්වීමෙන් පසුව සටන්කාමී ජාතිවාදී වාමාංශික ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් දකුණේ ඇති වූ කැරලිකාරිත්වයන්, ඝාතනය කිරීම් සහ අතුරුදහන්වීම් වැඩි විය. ඉන් අනතුරුව සිදු කරන ලද ත්‍රස්ත විරෝධී මෙහෙයුම්වලින් තවත් දහස් ගණනක් අතුරුදහන් විය, නැතිනම් මරා දැමිණ.

2009 මැයි මාසයේ යුද්ධය අවසන්වීමත් සමග ඒකාධිපති සහ හමුදාකරණය වූ සිංහල බෞද්ධ රාජ්‍යයක් බිහි විය. මර්දනකාරී රාජ්‍යය සහ රාජ්‍ය නොවන හමුදා කණ්ඩායම් වඩාත් වැඩි බලතල සහ සුජාත භාවයක් අත් කර ගත් අතර ප්‍රජාතන්ත්‍රවාදී නොවන ලක්ෂණ ව්‍යවස්ථාගත කිරීම හෝ නිත්‍යානුකූල කිරීම සිදු විය. රාජපක්ෂ පාලනය යුද්ධයේ අවසන් අදියරේ දී සහ ඉන් පසු කරන ලද අපහරණයන් තුළ සිදු වූ ඉමහත් ජීවිත සංඛ්‍යාවක් නැතිවීම සහ පීඩාව පිළිගත්තේ නැත. මානව අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරිත්වය මර්දනය කිරීම ආයතන ගත වූ අතර පාර්ලිමේන්තුවේ, අධිකරණයේ සහ රාජ්‍ය නොවන මාධ්‍යයේ සංවරණ සහ තුලන ක්‍රම පාගා දැමිණ. අන්තර්ජාතික පරීක්ෂාව ප්‍රතික්ෂේප කෙරිණ. ඒ සමගම සුවිශාල යටිතල පහසුකම් ව්‍යාපාති වලට අරමුදල් සපයා ගැනීමේදී ගෝලීය ප්‍රාග්ධනය, විශේෂයෙන්ම චීනයේ පිළිගැනීම රාජ්‍ය අංශයේ දේශපාලන අනුග්‍රාහකත්වය ව්‍යාප්ත කිරීම තහවුරු කෙරෙන ආක්‍රමණකාරී නව ලිබරල් සංවර්ධන උපාය මාර්ගයකට ඉඩ සැලසිණ.

## සිවිල් සමාජ සන්දර්භය

1971 ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල කුරිරු ලෙස මර්දනය කිරීම ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් සහ යුක්තිය පිළිබඳ තීරණාත්මක අවස්ථාවක් වූ අතර ඒ සමග බිහි වූ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂක පෙරමුණ වැනි සංවිධාන රජයේ වගවීම පෙන්වා දුන්හ. 1970 ගණන්වල වාමාංශික කොටස් රජයට එකතු වූ නමුත් වෘත්තීය සමිති ව්‍යාපාරය පාගා දැමීමත් සමග ඉන් ඉවත් වූහ. සිවිල් සමාජයේ අනෙකුත් ක්‍රියාකාරිකයෝ 1977 දී බිහි වූ ඒකාධිපති, නව ලිබරල් රාජ්‍යයට අභියෝග කළහ. 1980 ගණන්වල වාර්ගික ගැටුම උත්සන්නවීමත් සමග ජාතීන් අතර යුක්තිය සහ සාධාරණත්වය සඳහා වූ ව්‍යාපාරය (මර්ජ්), මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු, ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් රැකගැනීමේ ව්‍යාපාරය, මවුවරුන්ගේ පෙරමුණ සහ ස්ත්‍රී අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම් අධීක්ෂණය, සාමය ගොඩනැගීම සහ අවතැන්වීමට අදාල කරුණු ගැන අවධානය යොමු වූ වෙනත් නව ජාතික ක්‍රියාකාරීන් බිහිවීමට හේතු විය. 1980 සහ 1990 ගණන්වලදී අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ව්‍යාපාර සහ එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණවලින් රජයට වඩාත් බලපෑම් කෙරිණ.

1977 සිට 1994 දක්වා කාල පරිච්ඡේදය, සිවිල් සමාජය කෙරේ රජයේ සැකය සහ මර්දනයෙන් සනිටුහන් වූ අතර ඉන් සමාජයේ කැළඹිලිකාරී තත්ත්වය වඩාත් උත්සන්න විය. 1994 සිට 2005 දක්වා, විශේෂයෙන්ම 1990 අග භාගයේ දී සාම මුලපිරුම් සහ අන්තර්ජාතික මැදිහත්වීම් රාජ්‍යය සහ සිවිල් සමාජය අතර සහයෝගිතාවය සහ සම්බන්ධතාවය දිරිමත් කෙරිණ. එහෙත් 2006න් පසුව යුද්ධය නැවතත් උත්සන්නවීම සහ හමුදාකරණය සමග සිවිල් සමාජය, විශේෂයෙන් මානව අයිතිවාසිකම් සංවිධාන සහ රජය විවේචනය කළ මාධ්‍යය සෝදිසියට ලක් කිරීම, සැකය සහ මර්දනය නැවත පෙරමුණට පැමිණියේය.

2009 දී යුද්ධය අවසන්වීමෙන් පසුව රාජ්‍ය මර්දනය ඉහළ ගිය අතර සියලු ආකාරයේ දේශීය සහ විදේශීය පරීක්ෂාවට විරෝධය එල්ල විය. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණ රාජ්‍ය අනුග්‍රහයෙන්

හෙලා දුටු අතර සිවිල් සමාජයේ විවේචනය, විශේෂයෙන්ම මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන් දඩයම් කිරීම, තර්ජනය කිරීම, පහරදීම, අතුරුදහන් කිරීම හෝ මරා දැමීම සිදු විය. දැඩි බාධා එල්ල වුවද, කාන්තා ක්‍රියාකාරී ජාලය, සහ ආපදා කළමනාකරණය සඳහා වූ කාන්තා එකතුව 2013 දී සංවිධානය කළ ලිංගික ප්‍රචණ්ඩත්වයට යුක්තිය ලබා ගැනීම සඳහා වූ ප්‍රබල ව්‍යාපාරයක් නොකඩවා පැවතිණ.

දේශීය මානව අයිතිවාසිකම් සහ ස්ත්‍රී අයිතිවාසිකම් සංවිධාන එක්ව උල්ලංඝණය කිරීම් ලේඛන ගත කර එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණවලට සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් සංවිධානවලට දැනුම් දුන්හ. වින්දිතයන් සඳහා ආධාර, මනෝ සමාජීය සේවාවන්, ජීවන මාර්ග සැලසීම, ආරක්ෂාව, නිවාස, සෞඛ්‍යය, අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්ගේ වෙනත් අවශ්‍යතා නොකඩවා ලබා දෙන ලදී. උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම, (2010) සහ අතුරුදහන් පුද්ගලයින් පිළිබඳ ජනාධිපති කොමිසම (2013) වැනි නව ආයතන ඉදිරියේ සාක්ෂි දීමට ද වින්දිතයන් හට සිවිල් සමාජය විසින් ආධාර ලබා දෙන ලදී.

සිවිල් සමාජය රාජපක්ෂ පාලනයට එරෙහි දේශපාලන විපක්ෂයට ද සහාය ලබා දුන්නේය. ස්ත්‍රීන් සහ ගැහැනු ළමයින් ප්‍රචණ්ඩත්වයට ලක්වීමෙන් වළක්වා ගැනීම පිළිබඳ විපක්ෂ නායකගේ කොමිසමට ප්‍රකට ස්ත්‍රී අයිතිවාසිකම් ක්‍රියාකාරීන් ද ඇතුළත් විය. එමෙන්ම 2015 ජනාධිපතිවරණයේ දී විපක්ෂයේ පොදු අපේක්ෂකයාට සහාය දක්වීමට සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයක් ද බිහි විය. රාජපක්ෂ පරාජයෙන් පසුව පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් විපක්ෂ සන්ධානය ජය ගත් නිසා සිවිල් සමාජ අවකාශය තවත් පුළුල් විය.

ආරක්ෂක සහ සෝදිසි ව්‍යුහය සම්පූර්ණයෙන්ම ඉවත් නොකළ නමුත් තර්ජනවල පහත වැටීමක් පෙන්නුම් කළ අතර මාධ්‍යයට මානව අයිතිවාසිකම් සමබරව ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබිණ. ව්‍යවස්ථාදායක සභාව, මානව හිමිකම් කොමිසම, සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ ජාතික උපදේශන කමිටුව, සංහිඳියා යාන්ත්‍රණ සඳහා වන පළාත් කාර්ය සාධක බලකාය සහ තොරතුරු දැනගැනීමේ කොමිසම වැනි ආයතනවලට සිවිල් සමාජ සහ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන් පත් කෙරිණ. ආණ්ඩුවේ නිලධාරීන් හමුවීම සහ ආයතනවලට පිවිසීම පහසු විය. 2017 – 2020 ජාතික මානව අයිතිවාසිකම් ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීමේ දී බොහෝ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීහු දායක වූහ. රාජ්‍යය සමග සහයෝගයක් පවත්වා ගැනීම සිවිල් සමාජයට විවේචනාත්මක, ප්‍රතිපත්තිගරුක දුරස්ථභාවයක් පවත්වා ගැනීම අභියෝගයක් විය. අරමුදල් ලබා ගැනීම සිවිල් සමාජ මුලපිරුම්වලට අභියෝගයකි.

එමෙන්ම කෙටි කාලීන දේශපාලන ක්ෂිතිජයෙන් ඔබ්බට යන වඩාත් පුළුල් සහ වඩාත් දීර්ඝ කාලීන ව්‍යාපාර එකිනෙක ඡේදනය කරන නව ආයතනික ආකාරයන් ගේ අවශ්‍යතාවයක් ද පවතී.

## වින්දිතයන්ගේ තත්ත්වය

ගැටුමෙන් ජනිත කළ විවිධාකාර වූ හිංසා, වේදනා සහ වින්දිතභාවය නිසා "වින්දිතයන්" සම්බන්ධයෙන් පටු ආකාරයෙන් කතා කිරීම සංක්‍රාන්තික යුක්තියට ඇති ප්‍රධාන ගැටලුවකි. වින්දිත කණ්ඩායම්වල සහ පංතිවල ඉල්ලීම් සහ ප්‍රති ඉල්ලීම්වලින් වින්දිතභාවයේ දේශපාලනය පැහැදිලි ය. නිදසුනක් වශයෙන් අන්තර්ජාතික මානුෂීය ආයතන සහ රජය යුද්ධයෙන් පසුව අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් "පැරණි" සහ "නව" වශයෙන් වර්ගීකරණය විවාදාත්මක මෙන්ම අසමානතාවයක් ද වේ. එල්.ටී.ටී.ඊ.යේ හිටපු සටන්කරුවන්, විශේෂයෙන්ම ගැහැනු සටන්කරුවන් ඔවුන්ගේම ප්‍රජාවන් තුළ අභියෝගයකි. රජය ඔවුන් ගැන දැඩි සැකයෙන් පසුවේ. උතුරේ මුස්ලිම් සහ ඉන්දීය සම්භවයක් ඇති දෙමළ ප්‍රජාවන් මුහුණ දෙන හිංසා පීඩා ගැන යොමු වන්නේ අනෙක් අයට වඩා අඩු අවධානයකි.

දරිද්‍රතාවයේ සහ අසරණ භාවයේ ගැඹුරුම තැන් ඇතුලත් වන උතුර සහ නැගෙනහිර වින්දිතයින්ගේ අවශ්‍යතා පැහැදිලිවම දැකිය හැකිය. අවදානම් භාවයේ පොදු සන්දර්භය සහ සමාජ සුරක්ෂිත භාවයේ පවතින හිඩැස් නිසා ස්ත්‍රීන්ට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වේ. හමුදා සහ සිවිල් ආරක්ෂක වැන්දඹුවන් සහ ආබාධ සහිත පුද්ගලයන් ඇතුළු ගෘහමූලිකාවන් ගේ පවුල් වඩාත්ම අවදානමක් ඇති පිරිස් වේ. සමාජ සහ මානසික අභියෝගයන්ට මුහුණ දෙන, ලිංගික ප්‍රහාරවල වින්දිතයන්ට පීතෘ මූලික සමාජ ආකල්ප දරා ගැනීමට සිදු වන අතර තවත් අපහාසයට ලක්වීමට ඉඩ ඇත. නීති ක්‍රියා පටිපාටි ඇරඹීම සහ කතා කිරීමට සිදුවීම අතිරේක අනතුරු ය.

තවත් කනස්සල්ලක් වන්නේ වින්දිතයින් හඳුන්වන ආකාරයයි. තමන් අත්දුටු උල්ලංඝණයවීම් ගැන කතා කරන අය වින්දිතයින් වශයෙන් පමණක් හඳුනා ගනු ලබන "සාක්ෂි කෝෂ" බවට පත්වීමේ අනතුරක් ද ඇත. අදාල ප්‍රශ්නය වන්නේ උද්ඝෝෂණ ව්‍යාපාර සහ කරුණු කීමේ මුලපිරුම් හැඩ ගැසෙන්නේ කෙසේද? යන්නයි. නිදසුනක් වශයෙන් ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වගවීම පිළිබඳව අන්තර්ජාතිකව කරුණු දැක්වීම, ආර්ථික සාධාරණත්වය සහ තම පවුල් සහ තමන් පැවතීම සඳහා ස්ත්‍රීන් දෛනිකව ගෙන යන අරගලය සුළුකර දක්වයි.

# අතීත සංක්‍රාන්තික යුක්ති මුලපිරුම්

## *බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ විමර්ශන කොමිසම (1994 සහ 1998)*

1990 වන විට විශේෂයෙන්ම දකුණේ සහ බටහිර කැරලිකාරිත්වය සහ කැරලි මර්දනය නිසා දහස් ගණන් අතුරුදහන්වීම් සිදු විය. 1994 දී උතුර සහ නැගෙනහිර යුද්ධය නැවතත් ආරම්භවීමත් සමග නව අතුරුදහන්වීම් රැල්ලක් ආරම්භ විය. වසර 17ක් තිස්සේ ඒකාධිපති පාලනයක් පවත්වා ගත් සහ 1988න් පසුව වඩාත් මර්දනකාරී වූ එක්සත් ජාතික පක්ෂයට අභියෝග කිරීමේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එහි හවුල්කරුවෝ 1994 මහා මැතිවරණයේ දී අතුරුදහන්වීම් ප්‍රධාන මාතෘකාවක් කරගත්හ. මවුවරුන්ගේ පෙරමුණ දකුණ සහ බටහිර මැතිවරණ ජයග්‍රහණයේ මූලික භූමිකාවක් ඉටු කළ අතර චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග 1994 නොවැම්බර් ජනාධිපතිවරණය ජයග්‍රහණයේ දී ඇය මවුවරුන්ට යුක්තිය ඉටු කිරීමට දුන් පොරොන්දුව එයට ඉවහල් විය.

ජනාධිපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක 1988 සිට 1994 දක්වා කාලය තුළ සිදු වූ අතුරුදහන්වීම් පිළිබඳව විමර්ශනය කිරීමට කොමිසන් සභා තුනක් පිහිටු වූවාය. ඒවා කැමැත්තෙන් තොරව පුද්ගලයින් ඉවත් කිරීම හෝ අතුරුදහන් කිරීම් පිළිබඳව විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසන් සභා යනුවෙන් හැඳින් විණ[1]. අනෙක් සියලුම සිද්ධීන් සඳහා 1998 දී ජනාධිපති විමර්ශන කොමිසම යනුවෙන් සමස්ත දිවයින සඳහාම වූ කොමිසමක් පත් කළාය. කලාපීය කොමිසන් සභා වාර්තා 1997 දී ජනාධිපතිට ඉදිරිපත් කළ අතර ඒවා ඊට පසු වසරේදී ප්‍රකාශයට පත් කෙරිණ. සමස්ත දිවයින සඳහාම වූ වාර්තාව 2000 දී ඉදිරිපත් කරන ලද අතර ප්‍රකාශයට පත් වූයේ ඉන් වසර දෙකකට පසුවය.

කලාපීය කොමිසන් සභා තුන පැමිණිලි 27,000ක් විමර්ශනය කර අතුරුදහන්වීම් 15,000ක් තහවුරු කර ඇත. ඔවුන් තවත් පැමිණිලි 10,136ක් සමස්ත දිවයින සඳහා වූ කොමිසමට භාර දුන් අතර ඉන් අතිරේක අතුරුදහන්වීම් 4,473ක් හඳුනා ගැනිණ. ඉන් පසුව සමස්ත දිවයින සඳහාම වූ කොමිසම තම අධිකාරි බලයට නොගැනෙන නව පැමිණිලි 16,305ක් මානව හිමිකම් කොමිසමට[2] යොමු කළ අතර මානව හිමිකම් කොමිසම ඉන් සමහරක් 2006 දක්වා විමර්ශනය කොට ඉන් පසු නතර කෙරිණ. කොමිසන් සභා තුනෙන් සිද්ධීන් 1,681ක සැකකරුවන් නම්කර ඇති අතර සමස්ත ලංකා කොමිසම "වගකිව යුතු පුද්ගලයන් සිය ගණනාවක් හඳුනා ගෙන" ඇත. මෙම ආයතන තුනේ නිර්දේශ අනුව අධිචෝදනා ඉදිරිපත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ තොරතුරක් නැති පුද්ගලයින් පිළිබඳ ඒකකයට යැවීමට පෙර විමර්ශනය කිරීම සඳහා පොලිසියේ අතුරුදහන් විමර්ශන ඒකකයක් ද පිහිටුවන දී. කෙසේ වුවත් ආරක්ෂක හමුදා සාමාජිකයන් කීප දෙනකු ගැන පමණක් නඩු විභාග පැවැත් වූ අතර දඬුවම් නියම වූයේ පහළ නිල දරු පුද්ගලයන් අතලොස්සකට පමණි.[3]

අනෙකුත් නිර්දේශවලින් අතුරුදහන් වූවන්ගේ පවුල්වලට වන්දි ගෙවීම සහ මරණ සහතික නිකුත් කිරීම කඩිනම් විය. 1995 සිට 1999 දක්වා මරණ සහතික 15,000කට වඩා නිකුත් කර ඇති අතර වින්දිතයන්ගේ පවුල් 16,000කට වැඩි සංඛ්‍යාවකට වන්දි ලබා දී ඇත.[4]

මෙම කොමිසන් සභාවලින් දණ්ඩ මුක්තිය පිළිබඳ කිසියම් ප්‍රබල ජයග්‍රහණයක් අත් කර නොගත් නමුත් අපරාධ සිදුවීම රජය විසින් පිළිගැනීම වැදගත් ය. මවුවරුන්ගේ පෙරමුණ මැතිවරණ දේශපාලනයට ඇතුළු වීමත් සමග එහි ප්‍රසිද්ධිය සහ දේශපාලන ගමන් මග පුළුල් වුවද පෙරමුණ සමග ක්‍රියාකාරී වූ විරුද්ධ පක්ෂයේ දේශපාලකයන් දෙදෙනකු අතුරුදහන් වූවන් සඳහා යුක්තිය ලබා ගැනීමේ අරමුණ අත හැරීම නිසා පෙරමුණ දුර්වල විය. තමන් බලයට පත් කළ ආණ්ඩුවේ දරදඬු ප්‍රතිපත්තිය නිසා මවුවරුන්ගේ පෙරමුණට සහ අනෙකුත් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට කොමිසන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලපෑම් කළ නොහැකි විය. ආණ්ඩුව සමග හෝ ආණ්ඩුව සහ එහි ක්‍රියාවලීන් තුළ වැඩ කරන ක්‍රියාකාරිකයින්ගේ ස්ථාවරයේ පැහැදිලිතාවයක් නොතිබුණ අතර සංවිධාන සහ ව්‍යාපාර වෙනත් දේශපාලන න්‍යාය පත්‍රවලට ඇතුළත් කර ගැනිණ.

## *උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම (2010)*

යුද්ධයේ අවසානයේ අපරාධ සිදුවූ බව ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව මතු වූ ජාත්‍යන්තර බලපෑම නිසා රාජපක්ෂ පාලනයට 2010 මැයි මාසයේ දී උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම පිහිටුවීමට සිදු විය. (LLRC) මෙම කොමිසමේ මැන්ඩේට් බලය 2002 සිට ඉදිරියට සිදු වූ අපරාධ ආවරණය වූ අතර සමහර බරපතල චෝදනා බැහැර කෙරිණ. ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර ක්‍රියාකාරීන් කීප දෙනෙක්ම, සමහර කොමසාරිස්වරුන් ගේ ආණ්ඩුව සමග පැවති සම්බන්ධතා, ස්වාධීන සහ අපක්ෂපාත විමර්ශනයක් පැවැත්වීමට ප්‍රතිපාදන නොමැතිවීම, සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂා කිරීමට ඉඩකඩ නොමැතිවීම සහ ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම වැනි කරුණු නිසා කොමිසමට ඉදිරිපත්වීමට අකමැති වූහ.

---

1 මෙම කොමිසන් සභා මධ්‍යම, වයඹ, උතුරු මැද සහ ඌව පළාත්, උතුරු සහ නැගෙනහිර පළාත් සහ බටහිර, දකුණ සහ සබරගමුව පළාත් වෙනුවෙන් විය.

2 Human Rights Watch "Recurring Nightmare: State Responsibility for Disappearances and Abductions in Sri Lanka" Volume 20, 2© March 2008, at HRW https://www.hrw.org/reports/2008/srilanka0308/2htm

3 එම.

4 එම.

සිවිල් සමාජයේ සහ දේශපාලන විපක්ෂයේ සැක සංකා තිබුණ ද දේශීය මානව අයිතිවාසිකම් සහ ස්ත්‍රී සංවිධානවල කිසියම් සහායක් ඇතිව බොහෝ වින්දිතයෝ කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දුන්හ. මාස 11ක කාලය ඇතුළත කොමිසම ප්‍රසිද්ධ සැසිවාර 57ක් පැවැත් වූ අතර ස්ථාන 40ක් බැලීමට ගියේය. දහසකට අධික සංඛ්‍යාවක් කොමිසම ඉදිරියේ සාක්ෂි දීමටත් 5,000කට අධික ලිඛිත ඉදිරිපත් කිරීම් ලබා දීමටත් ඉදිරිපත් වූහ.

උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම 2010 සැප්තැම්බර් මස ජනාධිපතිට අන්තර්වාර නිර්දේශ ඉදිරිපත් කොට 2011 අග දී අවසාන වාර්තාව ලබා දුන්නේය. කොමිසමේ කාලීන සහ විමර්ශන මැන්ඩේට් බලයේ සංයුතිය සහ වෙනත් අඩුපාඩු වලින් සීමා වුවද ආයතන නිර්දේශපාලනය කිරීම, නිර්හමුදාකරණය, ප්‍රකාශ කිරීමේ නිදහස, ඉඩම් ප්‍රශ්න, භාෂා අයිතිය, ප්‍රතිසංධානය, අතුරුදහන්වීම් විමර්ශනය සහ නඩු පැවරීම, සිවිල් ජනතාව මරණයට පත්වීම සහ වෙනත් චෝදනා පිළිබඳ නිර්දේශ මෙන්ම ගැටුමේ මූලික හේතු පිළිබඳ වැදගත් විශ්ලේෂණයක් අවසාන වාර්තාවට ඇතුළත් විය. එය විමර්ශනය කළ යුතු ආණ්ඩුව හා සම්බන්ධ සංවිධාන සහ පුද්ගලයන් නම් කොට එල්.ටී.ටී.ඊ.ය උතුරු පළාතෙන් පලවා හරින ලද මුස්ලිම් ජනතාව ගැන සහ ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ජනතාව ගැන වැදගත් නිර්දේශ ඉදිරිපත් කෙළේය.

ක්‍රියාත්මක කිරීම නොසැලකිල්ල, ඇල් මැරුණ සහ තෝරා ගත් කොටස්වලට සීමා වුවද එහි නිර්දේශ ජාතික හා අන්තර්ජාතිකව සාකච්ඡාවට ලක් වූ අතර එක්සත් ජාතීන්ගේ මණ්ඩපවලදී ආණ්ඩුවට බලපෑම් වැඩි කිරීමට හේතු විය. අඩු අපේක්ෂාවෙන් යුතු වුවද බොහෝ වින්දිතයෝ මෙම කොමිසම තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට සහ මහජන උනන්දුවක් ඇති කිරීමට ප්‍රයෝජනවත් අවස්ථාවක් කර ගත්හ.[5]

### *සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ උපදේශන කාර්ය සාධන බලකාය (CTFRM 2016)*

2015 දී ශ්‍රී ලංකාණ්ඩුවේ සම අනුග්‍රහය ඇතිව එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාවක් අනුව සංක්‍රාන්තික යුක්තිය සඳහා අ) සත්‍යය, යුක්තිය, ප්‍රතිසංධානය සහ නැවත සිදු නොවීම ආ) අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ කාර්යාලයක්, ඇ) හානිපූරණ කාර්යාලයක් සහ ඈ) විශේෂ නීති උපදේශකයෙකු සමග අධිකරණ යාන්ත්‍රණයක් පිහිටුවීමට තීරණය විය. මෙම යාන්ත්‍රණ සැලසුම් කිරීම සඳහා සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ උපදේශන කමිටුව රජය විසින් 2016 ජනවාරි මාසයේ දී පත් කරන ලදී. මෙම ආයතනය මානව අයිතිවාසිකම්, ශාස්ත්‍රීය, නීති, මහජන සෞඛ්‍ය, සහ මාධ්‍ය යන ක්ෂේත්‍රවලින් තෝරා ගත් ස්වාධීන, විශ්වසනීය පුද්ගලයන් එකොළහකින් යුක්ත විය. සාමාජිකයින් හයක් ස්ත්‍රීන් වන අතර සියලුම ප්‍රධාන ජන වර්ග නියෝජනය වුණි.

මෙම උපදේශන කමිටුව විසින් මහජන අදහස් විමසීම පිණිස ප්‍රාදේශීය නායකයන් සහ වින්දිතයන් ඇතුළත් පළාත් කාර්ය සාධක බලකා දිවයිනේ සෑම පළාතකටම පාහේ පත් කරන ලදී. එම සාමාජිකයන්ගෙන් අඩක්ම ස්ත්‍රීන් විය. ප්‍රාදේශීය සිවිල් සමාජ කණ්ඩායම් සහ ස්ත්‍රී සංවිධාන උපදේශන සාකච්ඡා සභා, මහජන අදහස් ඉදිරිපත් කිරීම්, ප්‍රාදේශීය රැස්වීම්, යොමුගත කණ්ඩායම් සාකච්ඡා සහ අංශීය/තේමාගත සාකච්ඡාවලට උනන්දුවෙන් සහභාගි වූ අතර අදහස් ඉදිරිපත් කිරීම් 7,306ක් විය. එහි අවසාන වාර්තාව 2017 ජනවාරි මාසයේ දී නිකුත් කරන ලද අතර ඉන් යාන්ත්‍රණ හතරට මෙන්ම සංක්‍රාන්තික යුක්තියට අදාල වෙනත් කරුණු ගණනාවක් පිළිබඳව ද පුළුල් සහ සවිස්තරාත්මක නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කෙරිණ. එහෙත් අන්තර්ජාතික විනිසුරුවන්ගේ සහභාගිත්වය ඇතිව විශේෂ උසාවියක් පිහිටුවීම සඳහා වූ නිර්දේශය පුළුල් දේශපාලන අවධානයක් සහ මතභේදයක් ඇති කරවීය.

## සිවිල් සමාජ නායකත්වයෙන් යුත් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරීත්වයන්

සිවිල් සමාජයේ නායකත්වයෙන් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක් සිදු නොවූ අතර සත්‍යය, යුක්තිය සහ ප්‍රතිසංධානය පෙරමුණට ගෙන ඒම සඳහා අන්තර්ජාතික, ජාතික සහ ප්‍රාදේශීය ප්‍රයත්න ගණනාවක් විය.

### *තොරතුරු සෙවීමේ දූත මෙහෙය: අන්තර්ජාතික ස්ත්‍රීවාදී සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් (2002)*

2002 දී ආණ්ඩුව සහ එල්.ටී.ටී.ඊ.ය අතර සටන්විරාම ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා අධීක්ෂණ දූත මෙහෙය ස්ථාපනය කිරීමත් සමග සාමය පිළිබඳව අලුත් බලාපොරොත්තු ඇති කෙරිණ. සාම සාකච්ඡාවලට ස්ත්‍රීන් ඇතුළත් නොවූ නිසා කාන්තාව සහ මාධ්‍යය සාමූහිකය සහ වාර්ගික අධ්‍යයනය සඳහා වූ අන්තර්ජාතික කේන්ද්‍රය ස්ත්‍රීන්ගේ සහභාගිත්වය අවධාරණය කිරීම සඳහා අන්තර්ජාතික දූත මෙහෙයක යෙදීමට කලාපීය සහ අන්තර්ජාතික ස්ත්‍රීවාදී සහ

5. මෙම වාර්තාව 2012 ජනවාරි 3 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ 'උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම වාර්තාව නිකුත් කිරීම' http://www.cpalanka.org/release-of-lessons-learnt-and-reconcilian-commission-llrc-report/ බැලිය හැකිය.

මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන්ට ආරාධනය කළහ.[6]

අන්තර්ජාතික නියෝජිත කණ්ඩායම් හමු වූ ස්ත්‍රී සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් අවතැන් වූ ස්ත්‍රීන්, දරිද්‍රතාවයෙන් පෙළෙන ස්ත්‍රීන් සහ ප්‍රචණ්ඩත්වයට ලක්වීමේ අනතුරක් ඇති ස්ත්‍රීන්ගේ අවශ්‍යතා ඉදිරිපත් කළහ. තානාපති දූත මෙහෙයන්ට වාර්තාවක් ඉදිරිපත් කොට ස්ත්‍රීන්ගේ දුක් ගැනවිලි, සාම කතා බහේ දී ස්ත්‍රීන්ගේ සාම වැඩ කටයුතු පිළිගැනීම සහ ස්ත්‍රීන්ගේ දුක් ගැනවිලි විසඳීමට විධිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාවය පෙන්වා දුන්හ. 2002 දී සාම කතාබහ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උප කමිටුවක් පිහිටුවන ලද අතර එය නැවත යුද්ධය ඇරඹීමට පෙර දෙවරක් රැස්විය.[7]

### *එල්.ටී.ටී.ඊ.ය විසින් (2010) උතුරු පළාතෙන් මුස්ලිම් ජනතාව පලවා හැරීම පිළිබඳ පුරවැසි කොමිසම*

1990 ඔක්තෝබර් මස එල්.ටී.ටී.ඊ.ය උතුරු පළාතේ වෙසෙන මුස්ලිම් ජනතාවට පැය කීපයක් ඇතුළත පිටව යෑමට නියෝග කෙළේය. කිලිනොච්චිය, මුලතිවු, යාපනය, මන්නාරම සහ වවුනියාවේ සමහර ප්‍රදේශවලින් 75,000කට අධික පිරිසක් පලවා හරින ලද අතර ඔවුන්ට සිය දේපොල ද ගෙනයෑම තහනම් විය. එසේ වුවත් මෙම පලවා හැරීම යුද්ධය පිළිබඳ බොහෝ වාර්තාවලට ඇතුළත් වූයේ නැත. ඊට ප්‍රතිචාර වශයෙන් නීතිය සහ සමාජය භාරය, ග්‍රාමීය සංවර්ධන පදනම, ප්‍රජා භාර අරමුදල, ජනතා මහලේකම් කාර්යාලය සහ ප්‍රමුඛ මුස්ලිම් උපදේශක කණ්ඩායමක් සමග සත්‍යය සෙවීමේ මුලපිරුමක් දියත් කෙළේය.

සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ අන්තර්ජාතික කේන්ද්‍රය සමග සමීපව වැඩ කරමින් සහ වෙනත් තැන්වල සත්‍යය සෙවීමේ අත්දැකීම් පදනම්ව, පලවා හරින ලද ප්‍රජාවන්ගේ අත්දැකීම් සහ අදහස් රැස්කිරීම, වාර්තා කිරීම සහ සම්පිණ්ඩනය කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය උපරිම ආකාරයෙන් පවත්වා ගැනීමට හැකි වන ආකාරයෙන් පුරවැසි කොමිසම සැලසුම් කරන ලදී. අත්දැකීම් ලේඛනගත කිරීමට පුහුණු කළ ප්‍රජාවේ සමීක්ෂකයින් විසින් සම්මුඛ සාකච්ඡා සිය ගණනක් පැවැත් වූ අතර උතුරු පළාතෙන් අවතැන් කරන ලද මුස්ලිම් ප්‍රජාව ආසන්නයට ගොස් කොමිසමේ කරුණු විභාග කිරීම් පැවැත්විණ.

වසර දෙකකට අධික කාලයක් තිස්සේ පලවා හැරීම් සහ එහි ප්‍රතිවිපාක ලේඛන ගත කළ පුරවැසි කොමිසම, ප්‍රමුඛ සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් අගය කළ වාර්තාවක් එළි දැක්වීමට සමත් වූයේය. එම වාර්තාවෙන් පලවා හරිනු ලැබීමේ අත්දැකීම්, දශක දෙකක් තිස්සේ අවතැන්වීම සහ නැවත පදිංචිය ගැන අවධානය යොමු කොට ආණ්ඩුවට සහ අන්තර්ජාතික ප්‍රජාවට නිර්දේශ ඉදිරිපත් කෙළේය. එය උතුරේ මුස්ලිම් ප්‍රජාවේ අදහස් සහ අත්දැකීම් ඔවුන්ගේ ම හඬින් වාර්තා කර ඇත. වැඩි දුරටත් එය ක්ෂතිය, අහිමි කිරීම සහ කොන් කිරීමේ නිහඬ කරන ලද අත්දැකීම්වලට මහජන සුජාත භාවයක් ලබා දුන් අතර ඉල්ලීම් සඳහා ප්‍රබල වේදිකාවක් සැපයුවේය.

### *දෙමළ මුස්ලිම් සිංහල සහෝදරියන්ගේ කණ්ඩායම: විශාල වැදගත්කමකින් යුත් දේශීය මුලපිරුමක්*

ශ්‍රී ලංකාවේ නැගෙනහිර දෙමළ, මුස්ලිම් සහ සිංහල වාර්ගික කණ්ඩායම්වල මුසුවක් දක්නට ඇත. වසර 30ක් වාර්ගික බෙදීම් මත පැවති ගැටුම සහ යුද්ධය නිසා විශ්වාසය සහ ගරුකිරීම බෙහෙවින් යටපත් කළ අතර අගතීන් සහ අමනාපකම් දැඩිව මුල් බැස ගත්තේය. ආදරය, පොදු අත්දැකීම් සහ අරගලය මත පදනම්ව සමාජ බැඳීම වාර්ගික සීමාවන් ඉක්මවා ගොස් සහයෝගිතාවය සහ සහෝදරත්වය ගොඩනැගීම සූරියා සංවිධානයේ ප්‍රයත්නයට කේන්ද්‍රීය වේ.

සූරියා සංවිධානය 1991 දී බිහි වූයේ කොළඹ වාර්ගිකව වෙන්කරන ලද අභ්‍යන්තරව අවතැන් පුද්ගලයන්ගේ කඳවුරුවල කාන්තාවන් අතර වැඩ කරන කාන්තා එකතුවක් ලෙසිනි. නව කුසලතා ඉගෙන ගැනීමට උතුරෙන් පලවා හරින ලද මුස්ලිම් ස්ත්‍රීන් සමග නැගෙනහිරෙන් අවතැන් වූ දෙමළ ස්ත්‍රීන් එක් කළ සූරියා සංවිධානය එදිරිවාදිකම්, සැකය හා ප්‍රචණ්ඩත්ව වාතාවරණයක් පැවති නමුත් ඔවුන් එකට සම්බන්ධ කිරීමට සමත් වූවාය. සැකය, අගතිය සහ කුරිරුකම් දක්නට තිබුණ ද මුස්ලිම් සහ දෙමළ කාන්තාවෝ ක්‍රම ක්‍රමයෙන් එකිනෙකාගේ අත්දැකීම් පැවසීමට සහ එකිනෙකාගේ යථාර්ථයෙන් ඉගෙන ගැනීමටත් පුරුදු වූහ. එය දුරස්ථභාවය සහ වේදනාව පිළිගනිමින් සහයෝගිතාවයේ සහ අවබෝධයේ බැඳීම් ගොඩනැගීමේ පළමු පියවර විය.

---

6 මෙම කණ්ඩායම ආචාර්යඃ එලිසබත් (ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් බ්‍රිතාන්‍ය හිටපු සාමාජිකා), ශාන්ති ඩෛරියම්(මැලේසියාව) ෆ්ලොරෙන්ස් ඔඩර් (උගන්ඩා), ලසා කොයිස් (ඇමෙරිකා එක්සත් ජනපදය), සහ සෝනියා ජබ්බාර්(ඉන්දියාව). ශ්‍රී ලංකා සාමජිකාවන් කුමුදුනී සැමුවෙල්, ඩල්සි ද සිල්වා, සරෝජා සිවචන්ද්‍රන් සුල්ෆිකා ඉස්මයිල්, යුමුනා ඉබ්‍රහීම්, කමලිනී කදිරවේලායුදප්පිල්ලයි, විජි මුරුගයියා, අමරා හපුආරච්චි, චාන්දනී හේරත්, ඇනී කුරියන්, සුමන්ගලී අලුත්ගම, ශාමා රණවන සහ සිත්රලේගා මෞනගුරු. ශාන්ති තම්බයියා සහ ප්‍රියා තංගරාජා පරිවර්තනයෙන් සහාය වූහ.

7 ඊට පසු වසරේ සාම සාකච්ඡා පැවැත්වීමට ආණ්ඩුව සහ එල්.ටී.ටී.ඊ.ය නියෝජිත කණ්ඩායම් නම් කළහ. එල්.ටී.ටී.ඊ.ය තම කාන්තා අංශයේ ප්‍රධානි, තමිලිනි සුබ්‍රමනියම්, සහ කායා සෝමසුන්දරම්, ප්‍රෙමිලා සෝමසුන්දරම්, සුතමතී සන්මුගරාජා සහ යාලිනී බාලසිංහම් ඉදිරිපත් කෙළේය. එල්.ටී.ටී.ඊ. කණ්ඩායමේ උපදේශිකාව පත්මිනී සිත්තම්බරනාදන් ය. ආණ්ඩුවේ නියෝජිත පිරිසට ආචාර්ය කුමාරි ජයවර්ධන, ආචාර්ය දීපිකා උඩගම, ආචාර්ය ෆසීලා එම් රියාස්, කුමුදිනී සැමුවෙල් ඇතුළත් වූහ. ෆයිසුන් සකාරියා සහ ආචාර්ය ඇස්ට්‍රිඩ් හෙයිබර්ග් නෝර්වීජියානු පහසුකාරකයෝය. (SCGI) බලන්න, කුමුදිනී සැමුවෙල් "ස්වයං පාලනයේ වැදගත්කමඃ ස්ත්‍රීන් සහ ශ්‍රී ලංකා සාම සාකච්ඡා' 2010 නොවැම්බර් OPINION Centre for Humanitarian Dialogue at https://www.files.ethz.ch/sn/124926/2010_11_the%importance520of%20autonomy%20-2020Women%20and%20the%20Sri%20Lankan%20Peace%20Negotiations See also zT|First meeting of the sub-committee on gender issues (SGI) held in Kilicochchi at http://www.peaceagreemaents.org/wview/1277/first+meeting+of+the+sub-committee+on+gender+issues+(SG)+held+in+Kilinochchi

පොදු සංස්කෘතික භාවිතාවන් සහ අන්‍යෝන්‍ය පැවැත්ම වාර්ගික, ආගමික ප්‍රජාවන් යා කෙරෙන්නේ කෙසේදැයි ගවේෂණය කළ සූරියා සංවිධානය එය අන්‍යෝන්‍ය ගරුත්වය සහ විශ්වාසය නැවත ගොඩනැගීමේ වේදිකාවක් විය හැකි බව දුටුවාය. නිදසුනක් වශයෙන් පුනච්චිමුනෙයි කාන්තා සංවිධානය ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වූයේ එළවලු වෙළෙන්දන් සහ සංගමයෙන් අලෙවි කරන පැදුරු මිලදී ගැනීමට පැමිණි දෙමළ ජනයා ආරක්ෂා කිරීමෙනි.

වඩාත් මෑතක දී සූරියා සංවිධානය පශ්චාත් යුද සමයේ තියුණුව ඉස්මතු වූ මුස්ලිම් විරෝධී හැඟීම් ගැන සාකච්ඡා කිරීමට දෙමළ, මුස්ලිම් සහ සිංහල කාන්තාවන් එකට එක් කෙළේය. කාන්තාවෝ මෑතක දී ප්‍රචණ්ඩ ක්‍රියා පැවති අලුත්ගම සහ බේරුවල කාන්තා සහෝදරියන්ට ඔවුන්ගේ වේදනාව සහ චිත්තසංවේගය පිළිබඳව දුකට පත්ව දිරිමත් කිරීමේ ලිපි යැවූහ. දෙමළ මුස්ලිම් සිංහල සහෝදරියන්ගේ කණ්ඩායම්, ප්‍රචණ්ඩත්වයේ ප්‍රාදේශීය ඉතිහාසය සහ ජාතිවාදී සහ වාර්ගික අසහනයන් පිළිබඳව ගම්වලදීත් මඩකලපුව දිස්ත්‍රික්කයෙන් පිටතත් දිගටම රැස්වෙති. පසුගිය වසරේ දී මෙම කණ්ඩායම 1990 දී නැගෙනහිර පළාතේ සිදු වූ ඝාතන සැමරීමට එක් වූයේය. ඉන්පසු වඩාත් මෑතක දී ආගම් පදනම් පුද්ගල තත්ත්වය සහ පවුල් නීති සංශෝධනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් සංකච්ඡා කිරීමේ අවකාශයක් නිර්මාණය කරගන්නට විය.

සාකච්ඡා සහ සංවිධාන ස්ත්‍රීන්ට එකිනෙකාගේ අනන්‍යතාවයේ වටිනාකම සහ වගකීම් පිළිබඳ අවබෝධයක් වර්ධනය කර ගත හැකි මිත්‍රශීලි සහ විශ්වාසවන්ත අවකාශයක වටිනාකම දැකීමට ඉවහල් වේ. එම ක්‍රියාවලිය තුළ මතුවිය හැකි බොහෝ අභියෝග, එවැනි අවකාශ මල්ඵල ගැන්වීමට අවශ්‍ය තත්ත්වයන්, විශේෂයෙන් ම සංවාදයකට පිවිසීමට පෙර පසුබිම ප්‍රවේශමෙන් සකස් කිරීමේ වැදගත්කම දැකීමට ඉවහල් වේ. එවැනි ආත්මීය ක්ෂුද්‍ර අවකාශ හිමි වන්නේ රාජ්‍යයට හෝ රාජ්‍ය නොවන සංවිධානවලට නොව විශේෂයෙන් සත්‍යය කීම සහ සත්‍යය සොයා ගැනීම පෝෂණය කිරීමේ වැදගත්කමක් ඇති ස්ත්‍රීන්ට ය.

## ශ්‍රී ලංකා සන්දර්භය තුළ උගත් පාඩම්

1. ලැබුණු අත්දැකීම්වලට ආමන්ත්‍රණය කළ නොහැකි මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාවේ සඳහන් යාන්ත්‍රණය මත පමණක් විශ්වාසය රඳවා නොගෙන සංක්‍රාන්තික යුක්තිය සඳහා පහත සිට ඉහළට යන පිවිසුමක් අතිශයෙන් වැදගත් ය. මෙම ප්‍රශ්නය බොහෝවිට ගත් කළ යථාර්ථයේ ගැඹුරටම කිඳා බසින, නමුත් නීතියෙන් පුද්ගල කැමැත්ත සහ එකිනෙකට සම්බන්ධතාවයක් නැතැයි පිළිගන්නා ස්ත්‍රීන්ට එරෙහි අපරාධ සඳහා යුක්තිය ලබා ගැනීමේ දී විශේෂයෙන් ම බරපතල ආකාරයෙන් පවතී.

2. ස්ත්‍රීන්ගේ සහභාගිත්වය සහ නායකත්වය සහ ප්‍රාදේශීයව කොන් කරන ලද කණ්ඩායම් සම්බන්ධකර ගැනීම, සංවේදී කරුණු ඉස්මතු කර දැක්වීමට හා සාම වැඩවලදී ස්ත්‍රීන්ගේ භූමිකාව පිළිගැනීම සහ ස්ත්‍රීපුරුෂ දැක්මකින් සංක්‍රාන්තික යුක්තියේ සංකල්ප ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒමේ අභියෝගයට අතිශයෙන් වැදගත් ය.

3. පීඩාවට පත් ප්‍රජාවන් රාජ්‍ය නායකත්වයෙන් යුත් සංක්‍රාන්තික ක්‍රියාවලීන් දකින්නේ කෙසේද යන්න සිවිල් සමාජ ක්‍රියාකාරීන් අවබෝධ කර ගත යුතුය. බොහෝ සිවිල් සමාජ කණ්ඩායම් උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම සහ අතුරුදහන් පුද්ගලයින් පිළිබඳ කොමිසම විවේචනය කර ප්‍රතික්ෂේප කළ නමුත් ජනතාව ඊට සහභාගි වී සාක්ෂි ලබා දුන්හ. ඇත්තෙන්ම එම සහභාගිත්වය නිසා මෙම ආයතනවලට තම සීමාවන් අතික්‍රමණය කිරීමට සිදුවිය.

4. ප්‍රතිසංධාන යාන්ත්‍රණ පිළිබඳ කාර්ය සාධක බලකාය මෙම ක්‍රියාවලියේ නෛසර්ගික සහ භාවිත වටිනාකම් දක්වයි. අව්‍යාජ සහභාගිත්වය වැදගත් වන්නේ සුජාත භාවය ගොඩනැගීමට, විශ්වාසය වැඩි දියුණු කිරීමට සහ අර්ථාන්විත නිමැවුමක් ලබා ගැනීමට පමණක් නොව ජනතාවගේ අරගලය සහ අත්දැකීම් බලගැන්වීම සහ ගරුත්වයක් ලබා දීම සහ ඒවා පවත්වා ගැනීම සඳහාය. වැඩි දුරටත් ඉහළම මට්ටමෙන් වින්දිතයින්ගේ සහභාගිත්වය සහ නියෝජනය සංක්‍රාන්තික යුක්ති ප්‍රයත්නයේ විශ්වසනීයත්වයට ද අතිශයින් වැදගත් ය.

5. රාජ්‍යයේ සහ එහි ආයතනවල නොකඩවා සිදුවන ගැඹුරු පරිණාමය නිසා සංක්‍රාන්තික යුක්තිය, ව්‍යවස්ථා සහ අධිකරණ සංශෝධන සමග සම්බන්ධ විය යුතුය. සුවිශේෂී සිද්ධීන් සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කිරීමෙන් රාජ්‍ය පුරවැසි සම්බන්ධතාවය සැලකිය යුතු ආකාරයෙන් වෙනස් වන්නේ නැත.

6. කොමිෂන් සභා සහ අනෙකුත් සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණවල නිර්දේශ නොකඩවා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සිවිල් සමාජය සංවිධානය කිරීම සහ සම්බන්ධ කර ගැනීමට උත්ප්‍රේරකයක් වශයෙන් ක්‍රියා කළ යුතුය. ස්වාධීන, ගැඹුරු විමර්ශන සහ සාර්ථක අභිචෝදනා ඉදිරිපත් කිරීම සඳහා සම්පත් වෙන් කළ යුතුය.

7. උල්ලංඝණය කිරීම් සඳහා විවිධ වූ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් වගකිව යුතු නිසා රාජ්‍යය කෙරේ යොමු වූ ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණවලින් පමණක් සත්‍යය සහ වගවීම ඇති කළ නොහැකිය. ආරක්ෂිත සහ විශ්වාස කටයුතු අවකාශ නිර්මාණය කිරීමට ප්‍රජා මූලික අවකාශ සහ වෙනත් මාර්ග අත්‍යවශ්‍ය ය.

8. අවසාන වශයෙන් සත්‍යය, සත්‍යය සෙවීම, සහ සත්‍යය කීම සංයුක්තයක් බව සිත්හි දරා ගත යුතුය. සියලුම සත්‍යය ඇත්තේ රජය වෙත නොවේ. සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය ස්ථානගතව සංවේදීවීමට නම් ප්‍රාදේශීය ක්ෂුද්‍ර අවකාශ මතුවිය හැකි ආකාරයට පහල සිට ඉහලට සත්‍යය සහ ප්‍රතිසංධාන ක්‍රියාවලියක් ගොඩනැගිය යුතුය.

## අනාගත අභියෝග

සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ පුළුල් ප්‍රශ්නය සිංහල බහුතරවාදී ජාතිකවාදය සමග ගැට ගැසී පවතී. කෙසේ වුවත් යුක්තිය, ප්‍රතිසංධානය සහ වගවීමේ ප්‍රයත්නයන් ශ්‍රී ලාංකික දේශපාලනය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමේ අවශ්‍යතාවය මත රඳා නොපවතී. නිශ්චිත සිද්ධීන් සම්බන්ධයෙන් සත්‍යය සහ වගවීම රජයේ කෙරේ නිරන්තරයෙන්ම කරන බලපෑමෙන් සාක්ෂාත් කර ගත හැකි බව සිතා ගත හැකිය. යම්තාක් දුරට තහවුරු කර ද ඇත. සත්‍යය සහ වගවීම කුඩා එහෙත් සැලකිය යුතු ජයග්‍රහණවලින් සතිටුහන් කරන නොනවත්වා කෙරෙන අරගල සහිත දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් විය හැකිය. එවැනි දීර්ඝ කාලීන ක්‍රියාවලියකට පදනමක් දැමීමේ දේශපාලන අවස්ථාවක දොරක් විවෘතව ඇත. දේශපාලන අවකාශය උපරිම කර ගන්නා අතර වත්මන් තත්ත්වයෙන් ප්‍රයෝජන ලබා ගැනීමට පෙළඹීම නිසා වැදගත් අගයන් සම්මුතීන්ට ලක් කිරීමට හා පීඩාවට පත් ප්‍රජාවන් සහ ඔවුන්ගේ නායකයන් දීර්ඝ කාලීනව පවත්වා ගත නොහැකි යාන්ත්‍රණ සහ ක්‍රියාවලීන්ට බැඳ තබන බව සැලකිල්ලට ගැනීම ද වැදගත් ය.

අදාල අභියෝගයක් වන්නේ යුද්ධයේ දී සිදු වූ දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩත්වය කෙරේ අවධානය යොමු කිරීම, ස්ත්‍රීන්ට එරෙහි වෙනත් ආකාරයේ ප්‍රචණ්ඩත්වය පමණක් නොව ගැටුමෙන් බාහිරව සිදු වූ ලිංගික ප්‍රචණ්ඩත්වය අමතක කෙරෙන්නේ ද යන්නයි. මෙම ගැටලුවේ අනෙක් පැත්ත වන්නේ ස්ත්‍රීන්ට එරෙහි අපරාධ හැඳින ගැනීම සහ නඩු පවරන ප්‍රමාණයෙන් පුළුල් අධිකරණ පද්ධතියේ සහ එදිනෙදා අත්දකින ප්‍රචණ්ඩත්වය සහ ගැඹුරින් ම පවතින විෂම පීතෘමූලික (hetero-patriarchal) ස්වභාවය පරිණාමය කළ හැකි ද යන්නයි. ආර්ථික සහ බෙදාහැරීමේ පවතින කොන් කිරීම බරපතල අභියෝගයක්ව පවතී. මෙම ප්‍රශ්නය විශේෂයෙන් ම ස්ත්‍රීන්ට බලපාන අතර පීඩාවට පත් ප්‍රජාවන් ගත් කළ යථාර්ථයට සම්බන්ධයක් නැති යුක්තිය පිළිබඳ පටු සංකල්ප අභියෝගයට ලක් කරයි. රාජ්‍යය සහ සිවිල් සමාජය සංක්‍රාන්තික යුක්තිය ගැන කතා කරන අතර ආර්ථික ප්‍රතිපත්ති අනුව බෙදා හැරීම වැඩි වැඩියෙන් වෙළඳ පොල බලවේග අනුව තීරණය වීමට ඉඩ හරියි. සමහර මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීහු ආර්ථික සහ සමාජ අයිතීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගැනීමට විරුද්ධ වෙති.

අවසාන වශයෙන් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරිකයන් අතිශයෙන්ම විවිධ මත දරන අතර දේශපාලන වශයෙන් ගැඹුරු බෙදීම් පවතී. ඇතැම් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාකාරිකයින් දකින්නේ එය පුළුල් දේශපාලන අරමුණකට ළඟාවීමේ මාර්ගයක් ලෙසිනි. වෙනත් අයට අරමුණ ඊටම සීමාවී පවතී. එහෙත් ගැඹුරු දැක්මක්, අර්ථාන්විත ක්‍රියාවලීන් සහ වාර්ගික ගැටුම් ආමන්ත්‍රණය කිරීමට පුළුල් ප්‍රයත්නයක් නැතිව වගවීම සඳහා ආයතන පිහිටුවීමෙන් කල් පවත්නා පරිණාමයක් ඇති නොවේ.

**ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ත්‍රික යුක්තිවකාල වකවානු**

| | |
|---|---|
| **1948-1949** | බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලැබීමෙන් පසුව මෑතක ඉන්දීය සම්භවයක් ඇති දෙමළ ජනතාව දහස් ගණනකගේ ඡන්ද බලය අහෝසි කිරීමෙන් ඔවුහු රටක් නැති අය බවට පත්වූහ. |
| **1956** | සිංහල පමණක් පනත සම්මත කිරීමෙන් සිංහල රාජ්‍ය භාෂාව බවට පත් විය. එම පනතට විරෝධය දැක් වූ දෙමළ ජනතාව සිය ගණනක් මරණයට පත්විය. |
| **1958** | නැවත හටගත් දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වයෙන් සිය ගණනක් මරා දමන ලද අතර තවත් බොහෝ දෙනෙක් අවතැන් වූහ. |
| **1971** | වාමාංශික ජාතිවාදී ජනතා විමුක්ති පෙරමුණේ පළමු නැගිටීම කුරිරු ලෙස මර්දනය කළ අතර රාජ්‍ය මර්දනය පුළුල්ව පැතිරිණ. |
| **1972** | පළමු ජනරජ ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දුන්නේය. |
| **1976** | උතුරු නැගෙනහිර වාර්ගික දෙමළ ජනතාව සඳහා වෙනම රාජ්‍යයක් ඉල්ලීමත් සමග තමිල් ඊලාම් කොටි සංවිධානය බිහි වී ඉල්ලීම ප්‍රබල මෙන්ම සටන්කාමී තත්ත්වයට පත්විය. |

| | |
|---|---|
| **1977** | වෙනම රාජ්‍යයක් සඳහා නැඹුරුවක් පෙන් වූ ද්‍රවිඩ එක්සත් පෙරමුණ (TULF) දෙමළ ප්‍රදේශවල පාර්ලිමේන්තු මැතිවරණය ජය ගැනීමත් සමග දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වය පුළුල්ව පැතිරීම. |
| **1978** | 1977 දී ජනාධිපති ජයවර්ධනගේ ජයග්‍රහණයෙන් පසුව දෙවන ජනරජ ව්‍යවස්ථාව සම්මත කර ගැනීම. විවෘත ආර්ථිකයක් සඳහා ප්‍රතිසංස්කරණ වැඩ සහ විධායක බලතල ජනාධිපති වෙත ඒකරාශිවීම ශීඝ්‍රයෙන් සිදු විය. |
| **1980** | වෘත්තීය සමිති වැඩ කටයුතුවලට දැඩි සීමා පැනවීමත් සමග මර්දනය වැඩි කිරීම. |
| **1981** | පොලීසියේ/ආරක්ෂක හමුදාවල සහාය ඇතිව යාපනය මහජන පුස්තකාලය ගිනි තැබීම. |
| **1983** | සැඟව සිට එල්ල කළ ප්‍රහාරයකින් එල්.ටී.ටී.ඊ.ය හමුදා භටයන් 13ක් මරා දමයි. ඉන් ජූලි අග භාගයේ දී රාජ්‍ය සහාය ඇතිව රට පුරා හටගත් ජාතිවාදී කලකෝලාහල වලින් දෙමළ ජනතාව සිය ගණනක් මිය ගිය අතර තවත් දහස් ගණනකගේ දේපොළ කොල්ල කෑම් සිදු විය. ඉන් උතුරට සහ ශ්‍රී ලංකාවෙන් පිටතට සරණාගතයෝ විශාල සංඛ්‍යාවක් පලා ගියහ. |
| **1985** | සාම සාකච්ඡා සඳහා වූ ප්‍රථම උත්සාහය ව්‍යාර්ථ විය. |
| **1987** | ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් සාකච්ඡාවට සහභාගි වූ කණ්ඩායමේ අභ්‍යන්තර දේශපාලන බලපෑම් නිසා ඉන්දියාවේ පැවති සාකච්ඡා අසාර්ථක විය. ශ්‍රී ලංකාණ්ඩුව දෙමළ සුළුතරයේ ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් තහවුරු කිරීමට පොරොන්දු වූ අතර ඉන්දියානු ආණ්ඩුව දෙමළ සටන්කාමීන් නිරායුධ කිරීමේ මාර්ගයක් ඇති කිරීමට පොරොන්දු විය. |
| **1988-1990** | එල්.ටී.ටී.ඊ.ය සහ ඉන්දියානු සාම සාධක හමුදාව අතර සටන් ඇතිවීමත් සමග ඉන්දියානු සාම සාධක හමුදාව දෙමළ ජනතාව කුරිරු පීඩනයට ලක් කිරීම. ජ.වි.පෙ. දකුණු සහ බටහිර ප්‍රදේශවල ඉන්දියානු හමුදා මැදිහත්වීමට එරෙහිව කැරැල්ලක් දියත් කිරීම. කැරැල්ලෙන් සහ කැරලි මර්දන මෙහෙයුම්වලින් දහස් ගණන් මරණ සහ අතුරුදහන්වීම් වාර්තා විය. |
| **1990** | ඉන්දියානු සාම සාධක හමුදාව ඉවත්වීමත් සමග යාපනය එල්.ටී.ටී.ඊ.ය යටතට පත්වීම. එරාවූර් සහ කාත්තන්කුඩි මුස්ලිම් පල්ලි ඇතුළත් නැගෙනහිර ගැටුම් සහ සමූහ ඝාතන රැල්ලක් සිදුවීමත් සමග දෙමළ සාමාන්‍ය ජනතාව කෙරේ පළිගැනීමේ ප්‍රහාර එල්ල කිරීම. ඔක්තෝබර් මාසයේ දී එල්.ටී.ටී.ඊ.ය උතුරු පළාතෙන් සියලුම මුස්ලිම් ජනතාව වග විභාගයක් නැතිවම පලවා හැරීම. |
| **1991-92** | නැගෙනහිර යුද්ධය ඇරඹීමත් සමග අවතැන්වීම් විශාල වශයෙන් සිදුවීම. |
| **1994** | වසර 17ක එක්සත් ජාතික පක්ෂයේ පාලනයෙන් පසුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග බලයට පත්වීම. පළමු සහ එකම ජනාධිපතිනිය වූ ඇයට සාමය සඳහා ජනවරමක් ලැබුණ අතර බහුත්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට සහ යුද්ධය අවසන් කිරීමට දේශපාලන එකඟතාවයක් ඇති කර ගැනීමට උත්සාහ ගැනිණ. අතුරුදහන්වීම් පිළිබඳව කලාපීය ජනාධිපති කොමිෂන් සභා තුනක් සහ 1988 දී 'සමස්ත දිවයින' කොමිසමක් පිහිටුවන ලදී. |
| **1995-1996** | ශ්‍රී ලංකා යුද හමුදාව උතුරේ නගරය, යාපනය අත්පත් කර ගැනීමට ගුවනින් බෝම්බ දැමීම ඇතුළුව විශාල ප්‍රහාරයක් දියත් කිරීම. ඔවුන් යාපනය අත්පත් කර ගත් අතර එල්.ටී.ටී.ඊ.ය පසු බැස්සේය. සාමාන්‍ය ජනතාව සිය ගණනක් මරා දැමිණ, නැතිනම් අතුරුදහන් විය. |
| **1996** | ශ්‍රී ලංකාව මානව හිමිකම් කොමිසමක් ස්ථාපනය කරයි. හමුදා භටයන් 11 දෙනෙකු 18 හැවිරිදි ක්‍රිශාන්ති කුමාරස්වාමි දූෂණයකොට මරා දමයි. 1998 දී ලබා දුන් තීන්දුවෙන් චූදිතයින් හය දෙනකුට මරණ දඬුවම නියම විය. |

| | |
|---|---|
| **1998-2001** | කුමාරතුංග ඝාතන තැත. කොළඹ අන්තර්ජාතික ගුවන් තොටුපොළට එල්ල කළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් ශ්‍රී ලන්කන් ගුවන් යානා විශාල සංඛ්‍යාවක් විනාශ වීම. |
| **2002** | පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකාණ්ඩුව එල්.ටි.ටී.ඊ.ය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීම. |
| **2004** | නැගෙනහිර කාර්යධර සහ අණදෙන්නා එල්.ටී.ටී.ඊ.යෙන් බිඳී යැම. විශාල මරණ සංඛ්‍යාවක් සහ හානියක් සිදු කරමින් සුනාමිය කඩා වැදීම. |
| **2005** | ආණ්ඩුව සහ එල්.ටි.ටී.ඊ.ය අතර සුනාමි ආධාර බෙදා ගැනීම මත 2002 සටන් විරාමය බිඳ වැටේ. 2005 දෙසැම්බර් මස එල්.ටී.ටී.ඊ.ය ප්‍රහාර මාලාවක් එල්ල කරයි. |
| **2006** | පෙබරවාරි මාසයේ දී නැවත වරක් සාම සාකච්ඡා ඇරඹේ. එහෙත් ජූනි මාසයේ දී සාකච්ඡා නතරවීමෙන් පසුව වසර අවසානයේ දී සටන් විරාමය බිඳ වැටේ. එල්.ටී.ටී.ඊ.ය නැගෙනහිර ප්‍රදේශයේ ප්‍රධාන ජලාශයක දොරටු වසා දමයි. ශ්‍රී ලංකා හමුදාවෙන් ප්‍රති ප්‍රහාරයක් එල්ල කිරීමෙන් දහස් ගණනක් අවතැන් වේ. |
| **2007** | එල්.ටී.ටී.ඊ.යෙන් බිඳීගිය කණ්ඩායමක සහාය ඇතිව ශ්‍රී ලංකා හමුදාව නැගෙනහිරෙන් එල්.ටී.ටී.ඊ.ය ඉවත්කර එම ප්‍රදේශය "මුදාගත්" බව ප්‍රකාශ කරයි. |
| **2008** | 2008 මාර්තු මාසයේ දී බරපතල මානව අයිතිවාසිකම් අපහරණ සිද්ධීන් ගැන කෙරෙන විමර්ශන අධීක්ෂණය කිරීමට පැමිණි අන්තර්ජාතික විශේෂඥ කණ්ඩායම, බලධාරීන් තම වැඩට බාධා පමුණුවන්නේයැයි චෝදනා කරමින් ඉවත්ව යන බවට ප්‍රකාශයට පත් කරති. ආණ්ඩුව එම චෝදනා ප්‍රතික්ෂේප කරයි.<br><br>එල්.ටී.ටී.ඊ.යට එරෙහිව දැවැන්ත හමුදා ප්‍රහාරයක් උතුරු පෙරමුණුවල සහ යාපනයේ සිට දකුණට එල්ල කරයි. උතුරු ප්‍රදේශය පුරා දහස් ගණන් ජනතාව ආරක්ෂිත ස්ථාන සොයා යති. තවත් දහස් ගණනක් සටන් පවතින ප්‍රදේශවල කොටු වූහ. එල්.ටී.ටී.ඊ.ය පළමුව නිරායුධ විය යුතුයැයි පැවසූ ආණ්ඩුව සටන් විරාමය ප්‍රතික්ෂේප කරයි.<br><br>බොහෝ කලක් උතුරේ සහ නැගෙනහිර සිටි එක්සත් ජාතීන්ගේ නියෝජිතයින් ආණ්ඩුව ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට අපොහොසත්වීම නිසා එම ප්‍රදේශවලින් ඉවත් වේ. |
| **2009** | එල්.ටී.ටී.ඊ. නායකත්වය මරා දැමීමත් සමග 2009 මැයි 18 වැනිදා යුද්ධය අවසන් විය. ආණ්ඩුවේ හමුදා තාවකාලික රෝහල්වලට සහ සටන් මුක්ත කලාපවලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීමෙන් සාමාන්‍ය ජනතාව දහස් ගණනක් මිය යන්නට ඇතැයි සැක කෙරේ. උතුරු පළාතේ යාපනය අර්ධද්වීපයේ දකුණු කොටසේ සම්පූර්ණ ජනතාවම අවතැන්වීමෙන් ඉමහත් දුෂ්කරතාවලට මුණ දුන්හ.<br><br>යටත් වූ හෝ අත් අඩංගුවට ගත් සිය ගණනක් අතුරුදහන් කෙරේ.<br>හමුදාව විසින් මහා පරිමාණයෙන් ඉඩම් අත්පත් කර ගැනීම ඇතුළුව උතුර සහ නැගෙනහිර විශාල වශයෙන් හමුදාකරණයට ලක් වේ.<br><br>යුද්ධයේ අවසාන අවදියේ බරපතල ආකාරයේ මානව අයිතිවාසිකම් කඩ කිරීම් පිළිබඳව චෝදනා පුළුල්ව පැතිර තිබුණ ද ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාව ජය ගැනීමට සමත් වේ. |

| | |
|---|---|
| **2010-2011** | 2010 දී එක්සත් ජාතීන්ගේ මහ ලේකම්, ගැටුමේ අවසාන කාල සීමාවේ දී සිදුව ඇතැයි කියන අන්තර්ජාතික මානව අයිතිවාසිකම් සහ මානුෂික නීතිය උල්ලංඝණය කිරීම්වල වගවීම් සොයා බැලීමට විශේෂඥ කමිටුවක් පත් කෙළේය. 2011 අප්‍රේල් මාසයේ දී එම මණ්ඩලය සිය වාර්තාව ඉදිරිපත් කළ අතර ආණ්ඩුව එය ප්‍රතික්ෂේප කෙළේය.<br><br>ආණ්ඩුව 2002 සිට යුද්ධයේ වූ සිදුවීම් ගැන සොයා බැලීමට උගත් පාඩම් සහ ප්‍රතිසංධාන (LLRC) කොමිසමක් පත් කෙළේය. බොහෝ දේශීය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් සංවිධාන කොමිසම වර්ජනය කළ ද සිය ගණනක් සාක්ෂි දුන් අතර සැල කිරීම් 5000කට අධික සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරිණ. එම කොමිසම 2011 දී අවසාන වාර්තාව නිකුත් කළ අතර එහි ඉතා වැදගත් නිර්දේශ බොහෝ දෙනාගේ පැසසුමට ලක් විය. එහෙත් ඒවා ක්‍රියාත්මක කිරීම දුර්වල මට්ටමක පැවතිණ. |
| **2011-2014** | යුක්තිය සහ වගවීම ඉල්ලා සිටින වසරක් පාසා ක්‍රම ක්‍රමයෙන් දැඩිවන යෝජනාවක් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිසමට ඉදිරිපත් වේ. 2014 දී උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමෙන් ආවරණය වූ කාල පරිච්ඡේදයේ සිදු වූ අපරාධ සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් කිරීමට එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයට බලය පැවරුවේය. |
| **2015** | ජනවාරියේ පැවති ජනාධිපතිවරණයෙන් ජනාධිපති රාජපක්ෂ පරාජය වූයේය. අගෝස්තුවේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව ඔහුගේ පක්ෂයෙන් මන්ත්‍රී කණ්ඩායමක් පැරණි විපක්ෂය සමග ජාතික එකමුතු රාජ්‍යයන් පිහිටුවීමට එකඟ වූහ.<br><br>විධායක ජනාධිපති ක්‍රමය සහ කලින් පැවති පාලනය යටතේ ඉවත් කර තිබූ විධායක බලය කෙරේ වූ සංවරණ සහ තුලන බලතල නැවත ක්‍රියාත්මක කිරීමේ සංශෝධන සම්මත කෙරිණ. ව්‍යවස්ථාදායක සභාව සහ මානව හිමිකම් කොමිසම ප්‍රතිස්ථාපනය කෙරිණ.<br><br>වගවීම ප්‍රවර්ධනය කෙරෙන සහ පියවර හතරකින් යුත් සංක්‍රාන්තික යුක්ති වැඩ සටහනක් සඳහා කැපවීම දක්වෙන එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනාවකට ශ්‍රී ලංකාව සම අනුග්‍රහය දක් වූයේය.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව මහජන අදහස් ලබා ගැනීමට ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන නියෝජන කමිටුවක් ස්ථාපනය කරන ලදී. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් බවට පත් කෙරිණ. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුනෙන් දෙකක බහුතරයකින් සම්මතකොට ජනමත විචාරණයකට ඉදිරිපත් කළ යුතුය. |
| **2016** | අගමැති කාර්යාලයේ සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ මහ ලේකම් කාර්යාලයක් සහ සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් සැලසුම් කිරීම පිළිබඳව මහජන උපදෙස් ලබා ගැනීමට සන්හිඳියා යාන්ත්‍රණ කාර්ය සාධක උපදේශන බලකායක් ද පිහිටුවන ලදී.<br><br>මෙම උපදේශන කාර්ය සාධක බලකාය කලාපීය කාර්ය සාධක බලකා 15ක් පිහිටුවා රට පුරාම මහජන අදහස් ලබා ගැනීමට කටයුතු කරන ලදී. මෙම ක්‍රියාවලිය සම්පූර්ණ වීමට පෙරාතුව ප්‍රමාණවත් උපදේශනයක් නොමැතිව ආණ්ඩුව අතුරුදහන් පුද්ගලයින් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීමට පනතක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත්තේය.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන නියෝජන කමිටුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක සභාව/පාර්ලිමේන්තු අනු කමිටු සිය වාර්තා ඉදිරිපත් කර ඇති අතර එම වැඩ පිළිවෙළ දිගටම ක්‍රියාත්මක වේ. එහෙත් මහජන නියෝජන කමිටුවේ වාර්තාව විධිමත් සාකච්ඡාවක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැත. |
| **2017** | උපදේශන කාර්ය සාධක බලකාය තම වාර්තාව අගමැතිට සහ ජනාධිපතිට භාර දී විධිමත්ව නිකුත් කර ඇත. |

